**කොවිඩ්-19 සති පාසල**

**2021 - සිව්වන සතිය**

**10 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව**

## 2 පාඩම - පෘථිවියේ ප්‍රධාන භෞතික ලක්ෂණ

### සාගර සහ මුහුදු

* පෘථිවි ගෝලය මත ව්‍යාප්තව ඇති කරදියෙන් පිරුණු විශාල ජල ප්‍රදේශ සාගර නම් වේ.

* පෘථිවි තලයෙන් 71% ක් මහා සාගරයෙන් වැසී ඇත.

* එවැනි සාගර පහක් පෘථිවි තලය මත දක්නට ලැබේ.

1. පැසිෆික් සාගරය
2. අත්ලන්තික් සාගරය
3. ඉන්දියන් සාගරය
4. දක්ෂිණ සාගරය
5. ආක්ටික් සාගරය

* ඇතැම් සාගරවල ඉතා ගැඹුරු සාගරික ආගාධ පිහිටා ඇත.

උදා:  මරියානා ආගාධය
      මින්ඩනාඕ ආගාධය

* ගොඩබිම්වලින් සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් වට වූ හෝ සාගරවලට සම්බන්ධ වූ කරදිය ප්‍රදේශ මුහුදු නම් වේ.

උදා:  කැස්පියන් මුහුද
      ඒරල් මුහුද
      ජපන් මුහුද
      අරාබි මුහුද

**ක්‍රියාකාරකම**

01. සාගරයක් හා මුහුදක් යනු කුමක්දැයි වෙන වෙනම අර්ථ දක්වන්න.

02. පහත වගුව සම්පූර්ණ කරන්න

| සම්පූර්ණයෙන් ම ගොඩබිමෙන් වටවූ මුහුදු | අර්ධ වශයෙන් ගොඩබිමෙන් වටවූ මුහුදු | සාගරයට සම්බන්ධ ව සාගරයේම පිහිටි මුහුදු |
|---|---|---|
| | | |

03. මුහුදක් හෝ සාගරයක් යනු රටකට සම්පතකි. මෙම කියමන උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

04. සාගර දූෂණය වීමට හේතුවන මානුෂ ක්‍රියාකාරකම් ලියන්න.

05. ලෝක ආකෘති සිතියමක සාගර පහක් හා මුහුදු දහයක් ලකුණු කර නම් කරන්න.